# <u>පරිගණක ණය</u>

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සියලුම ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා රුපියල් ලක්ෂයක පරිගණක ණය මුදලක් ලබා දීමට කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ලද බව සතුටින් දැනුම් දෙමි.

- මෙම ණය මුදල ලබාදීමේ මූලික අරමුණ වනුයේ, නිවසේ සිට වුවද බාධාවකින් තොරව රාජකාරී කටයුතු පවත්වා ගැනීමයි. සියලුම සේවකයින් මෙම ණය මුදල ඉල්ලුම් කළහොත් ආයතනයට විශාල මුදලක් මෙම කාර්ය සඳහා වෙන් කිරීමට සිදුවන බැවින්, සත්‍ය වශයෙන්ම පරිගණකයක් අවශ්‍ය වන සේවකයින් පමණක් ඉල්ලුම්පත් මේ සඳහා යොමු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**<u>ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය වෙත පරිගණක මිලදී ගැනීම සඳහා ලබා දෙන ණය මුදල ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු කොන්දේසි සහ එම ණය මුදල සම්බන්ධව අනෙකුත් විස්තර.</u>**

1) ණය මුදල : රු. 100,000/- (උපරිමය) (ලබා දෙන ණය මුදලෙහි ප්‍රමාණය මසක වැටුප සහ වැටුපෙන් අඩු කිරීම් මත තීරණය වේ.)
2) පොළිය : 4.2% (වාර්ෂික)
3) වාරික ගණන : 60
4) ණය මුදල අලුත් කිරීම : මුලින් ලබාගත් ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ පසුව හෝ ණය මුදල ලබා ගෙන වසර 05කට පසුව, යන අවස්ථා දෙකෙන් පසුව එළඹෙන අවස්ථාව ණය මුදල අලුත් කිරීම සඳහා වන කාලය ලෙස සැලකේ.
5) ණය මුදල අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් සහ අදාළ ලේඛන :

I) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සිය තනතුරෙහි තහවුරු කරන ලද ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙම ණය මුදල අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

හෝ

II) විශ්වවිද්‍යාල සේවයේ කලින්, වෙනත් තනතුරක තහවුරු කරන ලද, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි අදාළ තනතුරෙහි පරිවාස කාල සීමාව පසුකරමින් සිටින, අඛණ්ඩ විශ්වවිද්‍යාල සේවයක් සහිත ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින්ද මෙම ණය මුදල අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

III) ණය මුදල අයදුම් කරන දිනට වයස අවුරුදු 55 නොඉක්මවිය යුතුය.

IV) සම්පූර්ණ අඩු කිරීම් මූලික වැටුපෙන් 40% සීමාව තුළ තිබිය යුතුය.

V) ණය ඉල්ලුම්කරු වසර 10ක සේවා කාලයක් ඉක්මවා ඇත්නම් ඇපකරුවන් අවශ්‍ය නොවන අතර පහත සඳහන් ලේඛන පමණක් අවශ්‍ය වේ.

i) ණය අයදුම් පත්‍රය
ii) පොරොන්දු පත්‍රය
iii) ණය ගිවිසුම
iv) ණය ඇප බැඳුම්කරය

VI) ණය ඉල්ලුම්කරුගේ සේවා කාලය වසර 10ක් ඉක්මවා නොමැති නම්, වසර 10ක සේවා කාලයක් ඉක්මවූ එක් ඇපකරුවෙකු ප්‍රමාණවත් වන අතර, සේවා කාලය වසර 5-10ත් අතර ඇපකරුවන් දෙදෙනෙකු අවශ්‍ය වේ. එසේම පහත සඳහන් ලේඛන අවශ්‍ය වේ.

i) ණය අයදුම් පත්‍රය
ii) පොරොන්දු පත්‍රය
iii) ණය ගිවිසුම
iv) ණය ඇප බැඳුම්කරය
v) යෝජිත ඇපකරු ප්‍රකාශය/ප්‍රකාශ
vi) පාරිතෝෂික මුදලෙන් ණය අඩු කිරීම සඳහා එකඟතාවය/ එකඟතා
vii) ඇපකරු බැඳුම්කරය/ බැඳුම්කර

6) ණය මුදල සම්බන්ධ අනෙකුත් කොන්දේසි :

I) ණය ඉල්ලුම් පත්‍රය සහ අනෙකුත් ලේඛන සමග (ඇමුණුම 'උ') හෝ (ඇමුණුම 'එ') හි දක්වා ඇති පිරිවිතයන්ට (Specification) අනුකූල වන පරිදි පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණකයක් මිලදී ගැනීම සඳහා වන මිල කැඳවුමක් (Quotation) ඉදිරිපත් කළ යුතුය.

II) මෙම ණය මුදල පරිගණකයක් (ඩෙක්ස්ටොප් හෝ ලැප්ටොප්) මිලදී ගැනීම සඳහා පමණක් භාවිතා කළ යුතු අතර මෙම ණය මුදලෙහි කිසිදු කොටසක් පරිගණකයක් මිලදී ගැනීමට හැර වෙනත් කිසිදු අරමුණක් සඳහා භාවිතා නොකළ යුතුය.

III) ණය මුදල ලබාගෙන මසක් ඇතුළත පිළිගත් ආයතනයකින් පරිගණකය මිලදී ගැනීම සිදුකළ යුතු අතර, පරිගණකය මිලදී ගැනීමට අදාළ බිල්පත හෝ එම බිල්පතෙහි සහතික කරන ලද පිටපතක් සහ වගකීම් සහතිකය හෝ වගකීම් සහතිකයෙහි සහතික කරන ලද පිටපතක් ලේඛකාධිකාරී කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

IV) ණය මුදල ලබාගෙන මසක් ඇතුළත අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට ණයකරු අපොහොසත් වුවහොත් අදාළ ණයකරු ලබාගත් ණය මුදල, එම ණයකරුගේ වැටුපෙන් අයකර ගැනීම සිදුකරනු ලබයි. (සම්පූර්ණ අඩුකිරීම් 40% සීමාව තුළ තිබිය යුතුය යන නිර්ණායකයන්ට යටත්ව) එවැනි පුද්ගලයෙකුට සිය වෘත්තීය කාලය තුළ වෙනත් කිසිදු ණය මුදලක් විශ්වවිද්‍යාලය විසින් ලබා දෙනු නොලැබේ.

7) මෙහි දක්වන ලද කොන්දේසීන්ට එකඟව ණය මුදල ඉල්ලුම් කිරීමට අවශ්‍යවන සියලු ලේඛණ ලේඛකාධිකාරී කාර්යාලය වෙත ඉදිරිපත් කළයුතු අතර, ලේඛකාධිකාරී කාර්යාලය මගින් අදාළ සියලු ලේඛණ වල නිරවද්‍යතාව පරීක්ෂා කරනු ලබයි. ණය මුදල ඉල්ලුම් කිරීමට අවශ්‍ය සියලු ලේඛණ නිවැරදිව ඉදිරිපත් කර ඇත්නම්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී නිර්දේශය සහිතව නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක හා පාලන) අනුමැතියෙන් අදාළ ණය මුදල නිදහස් කිරීම සිදු කරයි.